ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපනඥයින් සඳහා වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

ESP 1262/2252- ගුරු අධ්‍යාපනය පිළිබඳ පර්යාලෝක

අවසාන පරීක්ෂණය (දෙවන සමාසිකය) - 2008

කාලය - පැය තුනයි.

---

දිනය - 2008 දෙසැම්බර් 06 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

01. 'ආරම්භක පුහුණුව හා අඛණ්ඩ අධ්‍යාපන වැඩ සටහන් මගින් ගුරුභවතුන්ගේ වෘත්තිය නිපුණතා සංවර්ධනය කිරීම හා තිරසාර ලෙස පවත්වා ගෙන යාම සම්බන්ධව ගුරු අධ්‍යාපනය මගින් ලබා දිය යුතු මූලික දායකත්වයක් ඇත.'

(i) ගුරුභවතකු සතු විය යුතු වැදගත් වෘත්තිය නිපුණතා පහක් (05) දක්වන්න. (ලකුණු 15)

(ii) ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ආයතනයක් විසින් පවත්වා ගෙන යනු ලබන ආරම්භක හෝ සේවාස්ථ ගුරු අධ්‍යාපන වැඩ සටහනක් තෝරා ගන්න.

(iii) ඔබ ඉහත දැක්වූ වෘත්තිය නිපුණතා සංවර්ධනය කිරීම හා තිරසාර ලෙස පවත්වාගෙන යාම කෙරෙහි එම ගුරු අධ්‍යාපන වැඩ සටහන සැලසුම් කොට ඇති අයුරු විභාග කරන්න. (ලකුණු 18)

02. ගුරුවරුන් වෘත්තිකයින් ලෙස සැලකීම සඳහා පහත දැක්වෙන තත්ත්වයන් තිබිය යුතු බව හාර්ග්‍රීව්ස් (2000) දක්වා ඇත.

(i) වෘත්තිය සඳහා ප්‍රවේශය පාලනය කිරීම

(ii) නිශ්චිත විශේෂිත දැනුම් පදනමක්

(iii) වෘත්තිය පරිචයන් සඳහා නිදහස

(iv) සේවා තත්ත්වයන්

හාග්‍රීව්ස් (2000) දැක්වූ මෙම වෘත්තිය තත්ත්වයන් ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තිය තුළ දක්නට ලැබේ දැයි විභාග කරන්න.

(8 x 4 = 32 + 1 = එකතුව 33)

03. 'ශ්‍රී ලංකාවේ ගුරු මාරුවීම් හා ස්ථානගත කිරීම් සම්බන්ධයෙන් පැතිර පවතින විෂමතා හා දිස්වන අසාධාරණකම් නීතිරීති පැනවීම මගින් පමණක් නොව ඒවා ක්‍රියාත්මක කිරීමට බලකිරීම තුළින් නැති කළ යුතුය.'

(i) ශ්‍රී ලංකාවේ ගුරු මාරුවීම හා ස්ථානගත කිරීම් සම්බන්ධයෙන් පැතිර පවතින විෂමතා හා දිස්වන අසාධාරණකම් විභාග කරන්න. (ලකුණු 10)

(ii) මෙම විෂමතා හා අසාධාරණකම් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි ගුණාත්මකබව කෙරෙහි බලපාන්නේ කුමන ආකාරයෙන් ද? (ලකුණු 11)

(iii) වර්තමාන ශ්‍රී ලාංකික සන්දර්භයට අයත් වන ඉහත ගැටළු විසඳීම සඳහා ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 12)

04. (i) ගුරු අධ්‍යාපනයට ඇතුළත් කළ යුතු යහපත් ඇගයීම් (තක්සේරු) ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්ම පහක් (05) දක්වන්න. (ලකුණු 15)

(ii) ශ්‍රී ලංකාවේ එක් ගුරු අධ්‍යාපන ආයතනයක් තෝරා ගෙන එම ඇගයීම් ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්ම කෙතෙක් දුරට භාවිත වේද යන්න විභාග කරන්න. (ලකුණු 18)

05. (i) ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සඳහා වෘත්තිය සච්චාරිත්‍ර මාලාවක් හඳුන්වා දීමේ වැදගත්කම දක්වන්න. (ලකුණු 10)

(ii) ගුරුවරුන් සඳහා වෘත්තිය සච්චාරිත්‍ර මාලාවක් සැකසීමේදී අවධාරණය කළ යුතු ප්‍රධාන අංග පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන වැඩ සටහන්වල විෂයමාලාවට සාරධර්ම අධ්‍යාපනය හඳුන්වා දීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 13)

06. පහත දැක්වෙන මාතෘකා පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(i) ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ගේ වෘත්තිය සංවර්ධනයෙහි ලා ගුරු සංගම්වල භූමිකාව (ලකුණු 11)

(ii) සමාජයේ වෙසෙන පුද්ගලයින්ගේ සංවර්ධනය වෙත එල්ල වූ අධ්‍යාපන කාර්යයන් (ලකුණු 11)

(iii) ගුරුවරුන් තුළ ප්‍රත්‍යවේක්ෂණ කුසලතා සංවර්ධනය කිරීමේ වැදගත්කම. (ලකුණු 11)

- හිමිකම් ඇවිරිණි. -